# උසස් අධ්‍යාපනයේ සමකාලීන ගෝලීය යථාර්ථය; විචාරාත්මක අධ්‍යාපන දර්ශනය තුළ මාක්ස්

**කැප්පෙටිපොල ඤාණවිමල හිමි**

## ප්‍රවේශය

මාක්ස් සහ එංගල්ස් අධ්‍යාපනය ගැන ලීවේ අල්ප වශයෙන් වුවත් මාක්ස්වාදයේ අධ්‍යාපන ඇඟවුම් පැහැදිලිව දක්නට ලැබේ. අවම වශයෙන් ආයතනවල විධිමත් ලෙස අධ්‍යාපනය ලැබීමේ අර්ථයෙන් වුවත් අධ්‍යාපනය යන්න ඔවුන්ගේ කාර්යයේ ප්‍රමුඛ ස්ථානයක් ගත්තේ නැත. විධිමත් අධ්‍යාපනය මාක්ස්ගේ සහ එංගල්ස්ගේ කාලයේ ප්‍රධාන තැනක් නොගත්තද, ධනේෂ්වර බලය පෙරලා මූලික ව්‍යුහාත්මක වෙනස ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා තත්ත්වයන් සහ ඒවායේ අර්ථය පිළිබඳ පූර්ණ දැනුමකින් සමන්විත වීම අත්‍යවශ්‍ය කරුණක් බව දෙදෙනාම විශ්වාස කළහ. මාක්ස්වාදී අර්ථයෙන්, අධ්‍යාපනය ධනවාදය ප්‍රතිනිෂ්පාදනය කරන අතර අධ්‍යාපනයට ධනවාදය අඩපණ කිරීමේ හැකියාව ද ඇත. ධනවාදය, නව ලිබරල්වාදයට මෙන්ම සමාජවාදී මූලධර්මවලට අභියෝගාත්මක ආකාරයෙන් ස්වකීය න්‍යායාත්මක වර්ධනයන් සිදු කර ඇත. රොනල්ඩ් එෆ්. ප්‍රයිස් (1977, 68 පි.) සඳහන් කරන පරිදි, කොමියුනිස්ට් යුගය පිළිබඳ මාක්ස්ගේ දැක්මට අනුව පරාරෝපණයේ අනුභූති උත්තර යුගයක සහ මිනිසුන් වැඩි වැඩියෙන් ස්වයං-විඥානික සහ ස්වයං-තීන්දු ගන්නා කාල පරිච්ඡේදයක් තුළ විචාරාත්මක අධ්‍යාපනයක් සඳහා හැකියාව පවතී. මාක්ස් සහ එංගල්ස්ට අනුව සමාජ පරිවර්තනයන් සිදුවන්නේ සමාජය පුරා ප්‍රබුද්ධ මත හා න්‍යායන් පැතිරවීමේ ප්‍රතිඵලයක් ලෙස නොව, පන්ති අරගලය සහ පන්ති ක්‍රියාකාරකම් හරහාය. එය නිර්මාණය කිරීම මාක්ස්වාදී අධ්‍යාපන දර්ශනයක මූලික අරමුණයි. එය කළ හැකි වන්නේ මූලික වශයෙන් අධ්‍යාපනයේ වර්තමානයේ පවත්නා තත්ත්වයන් විචාරයකට ලක් කිරීමෙනි. මෙම ලිපිය ඊට ප්‍රවේශය සපයනු ලැබේ.

**මාක්ස්, එංගල්ස් සහ විචාරයේ පියවර තුනක්**

මාක්ස් සහ එංගල්ස් ඔවුන්ගේ තීරණාත්මක ව්‍යාපෘතිය නිර්වචනය කරන විට, ඔවුන් එය හැඳින්වූයේ 'දේවල වර්තමාන තත්ත්වය අහෝසි කරන සැබෑ ව්‍යාපෘතිය' ('The real movement which abolishes the present state of things') වශයෙනි (මාක්ස්, 1968, 60 පි.). මෙම ව්‍යාපෘතියේ කොන්දේසි ඇතිවන්නේ, දැනට පවත්නා කොන්දේසි ආශ්‍රයෙනි. මෙම සුවිශේෂ ව්‍යාපෘතිය වැදගත්, නමුත් එකිනෙකට වෙනස් පියවර තුනක ස්ථානගත වේ.

අ) එහි මූලික පියවර ස්ථානගත වන්නේ 'දේවල්වල වර්තමාන හෙවත් පවත්නා තත්ත්වයට (The present state of things) වන අතර, ව්‍යාපෘතිය පිහිටන්නේ ඒ මතය. එබැවින් ඒ ඒ තත්ත්වයන් පිළිබඳව විමසීමේ සහ එය එහිම කොන්දේසි මත තේරුම් ගැනීමේ අවශ්‍යතාව මෙම පළමු පියවරෙන් අදහස් කරයි.

ආ) දෙවන පියවර ස්ථානගත වන්නේ විචාරය වෙතටයි. විචාරයේ ප්‍රධාන කාර්යය වන්නේ මෙම පවත්නා දේවල තත්ත්වය 'අහෝසි කිරීමයි' ('abolish'), එනම් පවත්නා දේවලට ප්‍රතිවිරෝධී ස්ථාවරයක් ලබා ගැනීමයි, පවතින තත්ත්වයට එරෙහිව යාමයි.

ඇ) තෙවන පියවර පවත්නා තත්ත්වයට එරෙහිව ගොස් එයින් ඔබ්බට යෑමයි. 'මෙම විචාරාත්මක ව්‍යාපාරයේ කොන්දේසි දැන් පවතින කොන්දේසි පරිශ්‍රයෙන් ඇති වන බැවින් එය මෙම ව්‍යාපාරයේ ස්ථාවර පැවැත්මට පැමිණීමේ හැකියාව සහ ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුළම ආවේණික කොන්දේසිවලින් ඔබ්බට යාමට අපේක්ෂා කරයි.

මෙම අවස්ථා තුන අප කතා කරන විචාරාත්මක අධ්‍යාපනයක් පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශය පැහැදිලි කිරීමට උපකාරී වේ.

පළමු පියවරට අදාළව, විශ්වවිද්‍යාලයේ 'ඇතුළත' ක්‍රියාත්මක වන යාන්ත්‍රණයන් දැක්වීමත් ඒවායේ පදනම හෙළිදරව් කිරීම, අභ්‍යන්තර සබඳතා හෙළි කිරීම, ඒවා විසුරුවා හැරීම සහ ඒවායේ මූලාශ්‍රය හඳුනා ගැනීමත් අත්‍යවශ්‍ය වේ. මේ සඳහා, විශ්වවිද්‍යාල

අධ්‍යයනයන් පිළිබඳ නිසි විවේචනයක් අත්‍යවශ්‍ය වන අතර එමගින් සමකාලීන ගෝලීය උසස් අධ්‍යාපන භූමිය ව්‍යුහගත කර බලපෑම් කරන ප්‍රතිපත්ති සහ විශ්වවිද්‍යාලය හැඩගස්වන කෘති සහ ලේඛන, න්‍යායන් සහ කතිකාවන් පරීක්ෂා කළ හැකිය. සම්භාව්‍ය දේශපාලන ආර්ථික විද්‍යාඥයින්ගේ කෘති පිළිබඳ මාක්ස්වාදී විවේචනයකට සමාන ක්‍රමයක් හරහා එය කළ හැකි අතර, මෙයින් ප්‍රධාන ධාරාවේ උසස් අධ්‍යාපන පර්යේෂණ තුළ ලිබරල් චින්තනයේ පරස්පර විරෝධී මාර්ග සොයාගත හැකිය.

දෙවනුව, අපගේ විචාරය අර්බුදයේ පවතින විශ්වවිද්‍යාලයට 'එරෙහිව' ක්‍රියා කරන විෂය පැත්තේ ස්ථානගත විය යුතු අතර, ඒ සමඟම සමකාලීන විශ්වවිද්‍යාලය සංලක්ෂිත කරන ආධිපත්‍යය, ධූරාවලි, අත්පත් කර ගැනීම සහ සූරාකෑමට එරෙහිව ප්‍රතිරෝධය දැක්විය යුතුය. විවේචනයන් විශ්වවිද්‍යාලය තුළ සහ ඊට පරිබාහිර සිදුවන අරගල අධ්‍යයනය කළ යුතු අතර, ඒවායේ සංයුතිය (රොගෙරෝ, 2011), ආශාවන් සහ අරමුණු, ඔවුන් මතු කළ ප්‍රතිවිරෝධතා මෙන්ම ඔවුන් ස්ථාපිත කළ අනාගත ක්ෂිතිජයන් ද පර්යේෂණය කළ යුතුය. ඊට ඍණාත්මක ක්‍රමයක් පමණක් ප්‍රමාණවත් නොවේ. එබැවින් විචාරය ධනාත්මක ව්‍යාපෘතියක් සේ සිදු කළ යුතුය. මේ හේතුව නිසා, එහි තුන්වන අංගයෙන් බලාපොරොත්තු වන්නේ, අර්බුදය විසින් පනවා ඇති සීමිත ක්ෂිතිජයෙන් 'ඔබ්බට' බැලීමට සහ ඒවායේ ආරම්භක පෙනුමේදී අද ප්‍රත්‍යක්ෂ කළ හැකි නමුත් අනාගත විශ්වවිද්‍යාලය සඳහා පදනමක් නිර්මාණය කළ හැකි සමාජ සම්බන්ධතාවල අන්තර් සම්බන්ධතා සිතියම්ගත කිරීමට යි.

මෙබඳු ආකාරයේ විවේචනයක් මනෝරාජික අපේක්ෂාවක් කෙටුම්පත් නොකරන නමුත් පැරණි විශ්වවිද්‍යාලයේ හිස් කවචයන් තුළට පැමිණිය යුතු දේවල්වල ස්වරූපය හෙළි කරයි. හාර්ඩ් සහ නෙග්‍රි පැවසූ පරිදි, එවැනි විවේචනයක කාර්යය වන්නේ 'පංති දෙක අතර මෙන්ම ආධිපත්‍යය සහ විමුක්ති ආශාව අතර පවත්නා නිරන්තර අරගලයෙන් මතුවන ස්ථිරසාර, ඵලදායී ආකෘති පැහැදිලි කිරීමයි' (1994, 6 පි.). පහතින් අප විසින්, දැනට හඳුනාගත් අර්බුදයේ පවත්නා උසස් අධ්‍යාපනය පිළිබඳ විවේචනයකට පාඨක ඔබව යොමු කිරීමට උත්සාහ කරනු ලැබේ.

## උසස් අධ්‍යාපනයේ සමකාලීන ගෝලීය යථාර්ථය

උසස් අධ්‍යාපනයේ සමකාලීන ගෝලීය යථාර්ථය පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් වෙත යොමු වීමේ පූර්විකාවක් වශයෙන් සමකාලීන උසස් අධ්‍යාපනය, ධනවාදයට යටත් වී ඇති ආකාරය පැහැදිලි කිරීමට උත්සාහ කරමු. ඕනෑම මාක්ස්වාදී ආනුභවික අධ්‍යයනයක මෙන්, පළමුව, එහි (උසස් අධ්‍යාපනයේ) ධනවාදී ලක්ෂණ විස්තරාත්මකව හඳුනාගත යුතුය, අධ්‍යයනය කරන ලද සංසිද්ධි 'වර්ධනය වන ආකාරය' (developmental forms) සහ 'අභ්‍යන්තර බැඳීම්' (internal bonds) හඳුනා ගත යුතුය, කාලයත් සමඟ ව්‍යුහය සහ එහි වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මෙම අරමුණ සඳහා, එහි නිෂ්පාදන ක්‍රියාවලිය, හුවමාරුවේ සහ බෙදාහැරීමේ විශේෂතා සහ පරිභෝජනයේ ඒකීයභාවය වැනි උසස් අධ්‍යාපනයේ ආර්ථික යථාර්ථය තේරුම් ගැනීමට උපකාරී වන සම්භාව්‍ය දේශපාලන ආර්ථිකයේ මාක්ස්වාදී අනුවාදයක් භාවිතා කරමු. (Marx, 1973; Harvey, 2012). කෙසේ වෙතත්, මෙම ආකාරයේ විමසීමක් මගින් හුදෙක් ධනේශ්වර නිෂ්පාදනයේ කෘෂිකාර්මික හෝ කාර්මික මාදිලියේ නිගමන උසස් අධ්‍යාපන අංශයේ යථාර්ථය දක්වා නැවත යෙදවීමක් සිදු නොවේ. විශේෂයෙන් ශාස්ත්‍රීය ශ්‍රමය සහ ප්‍රාග්ධනය අතර ඇති ප්‍රතිවිරෝධී සම්බන්ධතා විශ්ලේෂණය කිරීමේදී සම්බන්ධතා හැඩගස්වන ආකාරය එවැනි කාර්මික මාදිලියේ නිගමනවලට වඩා අතිශය වෙනස් ස්වරූපයක් ගනු ලබයි. (Münch, 2014; Marginson, 2013).

### අධ්‍යයන ශ්‍රමය

උසස් අධ්‍යාපනයේ ආරම්භක ලක්ෂ්‍යය සැමවිටම අධ්‍යයන ශ්‍රමය සහ එහි කොන්දේසි සංවර්ධනය කිරීම සමග බැඳේ. මේ සම්බන්ධයෙන් කතා කිරීමේදී, මාක්ස්වාදී විචාරය, අධ්‍යයන ශ්‍රම තත්වයන් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන ධාරාවේ උසස් අධ්‍යාපන පර්යේෂණවල ප්‍රතිඵල සහ සාකච්ඡාවලට පමණක් සීමා නො වන අතර, ඒ හා සම්බන්ධ ගැටලු ක්‍රමානුකූලව ග්‍රහණය කර ගැනීමට ද භාවිත කළ හැකිය. (Winn, 2015 a). ඒ අනුව, අපට පෙනෙන පරිදි උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ගැටලුව

වන්නේ අධ්‍යයන ශ්‍රමයේ වඩාත් දෘඪ හා පුද්ගලීකරණය කරන ලද තරඟකාරිත්වයයි (Naidoo, 2018). මෙය, කළමනාකරණය නිසා ඇති වන වේගවත් බව (Vostal, 2016), තරඟකාරී මිනුම් සංවර්ධනය මෙන්ම ගෝලීය අධ්‍යයන ක්ෂේත්‍රයේ වටිනාකම් මැනීම සහ තක්සේරු කිරීම (Szadkowski, 2016 b, Woodcock, 2018); අධ්‍යයන කටයුතු විසුරුවා හැරීම (Unbundling), (McCowan, 2017); වැනි හේතූන්ගේ ද්විතීයික ප්‍රතිඵලකි. කෙසේ වෙතත් මේ තරඟකාරී බව අධ්‍යයන ශ්‍රමිකයාගේ කාංසා අත්දැකීම් ජනනය කිරීම, මානසික සෞඛ්‍යය අඩපණ කරන අතර, එය අවසාන වශයෙන් හෝ අවම වශයෙන්, ඔහු අධ්‍යයන කටයුතුවලින් පරාරෝපණය වීම (Alienation of academics) දක්වා වර්ධනය කරයි. (Hall, 2018).

**ප්‍රාග්ධනය**

මාක්ස්වාදී විචාරය අවධානය යොමු කරන්නේ වෙළඳපොළ හෝ වෙළඳපොළෙන් ජනනය වන තරඟකාරීත්වය පිළිබඳව නොව, ප්‍රාග්ධනය සහ අධ්‍යයන ශ්‍රමය අතර සම්බන්ධතාව කෙරෙහි ය. (Roggero, 2011; Winn, 2015a; Szadkowski, 2016a). ත්වරණය හෝ මෙට්‍රික්කරණය වැනි ප්‍රකාශනයන්ගෙන් පටන් ගෙන, එය මෙම ක්‍රියාවලීන්ගේ මූලාශ්‍ර සොයමින්, ශ්‍රමය උපග්‍රහණය කිරීමේදී ප්‍රාග්ධනය භාවිතා කරන විවිධ යාන්ත්‍රණ හඳුනා ගනී. මේ සියල්ල පැමිණෙන්නේ ප්‍රාග්ධනය (විශේෂයෙන් ම උසස් අධ්‍යාපනයේ ක්‍රියාකාරිත්වය තුළ) සමජාතීය ප්‍රපංචයක් නොවන බවට අනතුරු අඟවමිනි. මාගින්සන් (Marginson, 2013) නිවැරදිව පෙන්වා දී ඇති පරිදි, උසස් අධ්‍යාපනයේ ශුද්ධ ධනවාදී ආයතන, ප්‍රාග්ධන සීමාවල ක්‍රියාත්මක වේ. අධ්‍යයන ශ්‍රමයට සෘජුව හෝ වක්‍රව බලපාන ප්‍රාග්ධනය මූල්‍ය හෝ ශාස්ත්‍රීය ප්‍රකාශන ක්ෂේත්‍රවලින් අපට සොයා ගත හැකිය. එබැවින්, උසස් අධ්‍යාපනයේ දේශපාලන ආර්ථිකය පිළිබඳ විවේචනයක් ඔස්සේ අවධානය යොමු කරන්නේ මෙම ප්‍රාග්ධන ආකාර මගින් සකස් කරන ලද, අධ්‍යයන ශ්‍රමය අතර ඇති සම්බන්ධතා කෙරෙහි ය. ඒ සෑම එකක්ම එක්කෝ අධ්‍යයන විශ්‍රාම වැටුප් සන්දර්භය තුළ හෝ මූල්‍ය වෙළඳපොළවල් මත යැපීම හෝ එල්සිවියර් (Elsevier) වැනි දැනුම සංසරණය හා සම්බන්ධ සමාගම් විසින් ස්ථාපිත කර සංවර්ධනය කරන ලද මිනුම් පද්ධතියක් මත

හෝ යැපේ. කෙසේ වෙතත්, ධනේශ්වර උපකල්පනයේ ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කිරීම ස්වයං-ප්‍රඥප්ත (self-referential) අභ්‍යාසයක් පමණක් නොවන බව සැලකිල්ලට ගත යුතුය. එය දැඩි ලෙස බාධා විය හැකි වටිනාකම් ප්‍රවාහයන්හි වැදගත්කම හඳුනා ගැනීමට ඉඩ සලසයි, මෙසේ උසස් අධ්‍යාපන අංශය ප්‍රාග්ධන ව්‍යාපෘතියට බලපානු ලබයි. (Bell and Cleaver, 1982). එවැනි සලකා බැලීම් සඳහා ආරම්භක ලක්ෂ්‍යය වන්නේ අධ්‍යයන ශ්‍රමය ප්‍රාග්ධනය සඳහා වටිනාකමක් ජනනය කරන්නේ කොහේද, කෙසේද සහ කුමන තත්වයන් යටතේද යන ප්‍රශ්නයයි.

**ගෞරවය හෙවත් කීර්තිය**

ගෞරවය පැතිරවීමේ යාන්ත්‍රණයන්වලට මාක්ස්වාදී විචාරයෙන් හිමිවන්නේ සාමාන්‍ය සැලකිල්ලක් නොවේ. කෙසේ වෙතත්, මාක්ස්ට (1981) අනුව, ප්‍රාග්ධනය යම් ප්‍රදේශයක ශ්‍රමය අවශෝෂණය කරන විට, එය පවතින තත්වයන්ට (විධිමත් උපකල්පන) අනුවර්තනය වීමට බලපෑම් කරයි, සැබෑ පරිවර්තනයක් කිරීමට හැකි වන්නේ එවිට පමණි. වටිනාකම් ප්‍රකාශ කිරීම සඳහා ගෞරවය පැතිරවීමේ සංකීර්ණ යාන්ත්‍රණ භාවිතා කරන අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ප්‍රාග්ධනයේ මැදිහත්වීමේ නිශ්චිතභාවය තේරුම් ගැනීම සඳහා මාක්ස්වාදී අවබෝධය තීරණාත්මක වැදගත්කමක් දරයි (Blackmore, 2016). මෙම සන්දර්භය තුළ, උසස් අධ්‍යාපන අංශය සිතියම්ගත කිරීම සඳහා තීරණාත්මක සාධකයක් වන්නේ ගෝලීය, ජාතික සහ දේශීය අධ්‍යයන කීර්තිය ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටීමයි. මන්ද යත් විද්‍යාවේ සහ පොදු උසස් අධ්‍යාපනයේ ආර්ථික තරඟකාරීත්වය අධ්‍යාපන රාමුව තුළ ප්‍රාථමික වැදගත්කමක් දරන බැවිනි. (Marginson, 2013; Münch, 2014). උසස් අධ්‍යාපනය පිළිබඳ විවේචනයක කර්තව්‍යය වන්නේ කීර්තිය බෙදා හැරීමේ යාන්ත්‍රණයන් අධ්‍යයන ශ්‍රමයෙන් අතිරික්ත වටිනාකම නිස්සාරණය කිරීමේ යාන්ත්‍රණයන්ට සම්බන්ධ වන ආකාරය හෙළිදරව් කිරීම පමණක් නොව ඒවා සකස් කරන ආකාරය පිළිබඳව ද හෙළිදරව් කිරීමයි. මෙහිදී හොඳ උදාහරණයක් වන්නේ ජාතික සහ ආයතනික ඇගයීම් ක්‍රියා පටිපාටි රඳා පවතින සියලු වර්ගවල මිනුම් (Woodcock, 2018)

මඟින් අධ්‍යයන ශ්‍රම ආදානය නිශ්චිත සුවිගත සඟරා වෙත යොමු කිරීමට දායක වීමයි. (De Angelis and Harvie, 2009; Szadkowski, 2016 b).

එපමණක් නොව, අධ්‍යයන ප්‍රකාශකයන්ගේ කතිපයාධිකාරය පවත්වා ගැනීම සහ වැඩි කිරීම සඳහා කීර්තියේ කාර්යභාරය වඩ වඩාත් වැදගත් වෙමින් පවතී (Larivière, Haustein, and Mongeon 2015). එමෙන්ම මෙහිදී, ගෝලීය, ජාතික සහ ආයතනික මිණුම් සලකුණු සඳහා දත්ත සපයන්නන්ගේ වර්ධනය ද ඉහළ වැදගත්කමක් ගනී. මෙහිදී පුළුල් අධ්‍යයන සඟරා කලාප සහ දත්තවල මූලාශ්‍රය වන ස්කොපස් දත්ත සමුදායේ (Scopus database) හිමිකාරිත්වය සහ ඇගයීම් අරමුණු සඳහා භාවිත කරන විවිධ වර්ගයේ මිනුම්වල අධිකාරීත්වය දරන එල්සෙවියර් උදාහරණය වැදගත් වේ. එල්සෙවියර් යනු ලොව පුරා විශ්වවිද්‍යාල අතර කීර්තිය සඳහා පවතින තරඟයෙන් ප්‍රතිලාභ ලබන ගෝලීය වශයෙන් විශාලතම ධනවාදී ආයතනයයි (එහි සඟරාවල ප්‍රකාශන කීර්තිය ජනනය කරන බව කියනු ලැබේ.) (Tennant, 2018 a). අධ්‍යයන තත්ත්වය සඳහා වන ගෝලීය අරගලයේ තීව්‍රතාවය ප්‍රාග්ධනයේ පරිමාව වැඩිවීම මෙන්ම අධ්‍යයන ශ්‍රමයේ ගෙල මත ත්වරණය සහ තරඟකාරිත්වයේ පටිය තද කිරීම සමඟ අත්වැල් බැඳගනී. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලීන් සිසුන්ගේ සහ ශාස්ත්‍රඥයන්ගේ පැත්තෙන් එල්ල වන ප්‍රතිචාරවලින් ගැලවී යන්නේ නැත.

### විශ්වවිද්‍යාල අරගල අනුගමනය කිරීම

නැන්සි ෆ්‍රේසර් (Nancy Fraser) නිවැරදිව නිරීක්ෂණය කර ඇත්තේ, 'යුගයේ අරගල සහ අභිලාෂයන් පිළිබඳ ස්වයං පැහැදිලි කිරීමක්' ලෙස විචාරාත්මක න්‍යාය පිළිබඳ මාක්ස්වාදී අර්ථ දැක්වීම වැඩිදියුණු කිරීමට කිසිවෙකු සමත් වී නොමැති බවයි (1995, 97). මෙම වර්ගයේ න්‍යාය ඥානවිද්‍යාත්මක මට්ටමක් මත නොව දේශපාලනික මට්ටමක් මත පදනම් වේ. විවේචනය - මෙම අවස්ථාවේ දී, විචාරාත්මක විශ්වවිද්‍යාල අධ්‍යයනයන්හි විවේචනය - ධනවාදී විශ්වවිද්‍යාලය තුළ සහ ඊට එරෙහිව සිදුවන ව්‍යාපාරවල අරමුණු සහ ක්‍රියා සැලකිල්ලට ගනිමින් එහි පර්යේෂණ වැඩසටහන හැඩගස්වයි. කෙසේ වෙතත්,

මෙය සිදු කරන්නේ සම්පූර්ණ හඳුනාගැනීමක් හරහා සහ මෙම ව්‍යාපාරවල සරල දෘෂ්ටිවාදාත්මක මෙවලමක් බවට පරිවර්තනය වීම හරහා නොවේ. උසස් අධ්‍යාපන පද්ධතිය තුළ ආධිපත්‍යය, ධූරාවලිය, අත්පත් කර ගැනීම සහ සූරාකෑම යන සාධකවන නොපෙනෙන සහ නොපෙනෙන සම්බන්ධතාවල ප්‍රතිවිරෝධතා හෙළිදරව් කිරීමෙන් හා ඒවායේ ප්‍රවර්ග සහ ආකෘති භාවිතා කිරීමෙන් ඒවා වඩාත් හොඳින් හඳුනා ගත හැකිය. මෙම අංශයේ සිදුවන අරගල, විවේචනයට අනුපූරක වීමට සහ වර්ධනය කිරීමට පමණක් නොව, එහි අභ්‍යන්තර සීමාවන් ඉක්මවා යාමට ද සමත් වේ. අවධානයෙන් සිටින මාක්ස්වාදී විචාරකයින් ඔවුන්ගේ පාඨමාලාවලින් ආවරණය නොකළ ප්‍රතිවිරෝධතා උග්‍ර කිරීමට විශ්වවිද්‍යාල අරගලවලට එක්වෙයි. කෙසේ වෙතත්, විශ්ලේෂණයේ කාර්යය සහ දේශපාලන ප්‍රායෝගිකත්වයේ තීව්‍රතාවය අතර ස්වයංක්‍රීය සංක්‍රාන්තියක් නොමැත. මාක්ස්වාදී විචාරය භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිවිරෝධතාවන්ගෙන් එකක් ශාස්ත්‍රීය ප්‍රකාශනය තුළ විවෘත ප්‍රවේශය වටා ඇති මෑත කාලීන අරගල මගින් හෙළි වේ.

එක් අතකින්, ලොව පුරා විද්වතුන් විසින් සිදු කරනු ලබන නොගෙවූ ශ්‍රමය මත පදනම්ව ලාභ රැස් කරන ධනවාදී ප්‍රකාශකයන්ගේ කතිපයාධිකාරීත්වයක් වර්ධනය වෙමින් පවතී (Peekhaus, 2012¦ Larivière, Haustein, and Mongeon, 2015). අනෙක් අතට ප්‍රකාශන කර්මාන්තය වඩාත් විවෘතභාවයක් කරා මාරු කිරීම සඳහා අරගල කරන ජනප්‍රිය ව්‍යාපාරයක් පවතී. (suber, 2012). ඇත්ත වශයෙන්ම, වාණිජමය වශයෙන් නැඹුරු වූ විවෘත ප්‍රවේශ ආකෘතියක් කරා ක්‍රමයෙන් ගමන් කිරීමක් අපට නිරීක්ෂණය කළ හැකිය (නිදසුනක් ලෙස, වඩාත්ම 'කීර්තිමත් සඟරාවල' හඳුන්වා දී ඇති 'ලිපි සැකසුම් ගාස්තු' වල ජනප්‍රියතාවයේ වර්ධනය) (Mirowski, 2018; Mirowski, 2015). ඉහතින් සාකච්ඡා කරන ලද එල්සෙවියර්, ද්විත්ව උපාය මාර්ගයක් භාවිතා කරමින් මෙම වෙනස්වන භූ දර්ශනයට අනුවර්තනය වෙමින්, එහි ලාභ ආන්තිකය ස්ථාවර හා ඉතා ඉහළ මට්ටමක තබා ගැනීමට උත්සාහ කරන ප්‍රකාශකයන්ගෙන් කෙනෙකි. එක් අතකින්, එය දත්ත සහ විශ්ලේෂණ සපයන්නෙකු බවට පත්වෙමින්, ප්‍රකාශයට පත් කරන සඟරාවල සහ දර්ශකවල තීරණාත්මක ස්ථානය ශක්තිමත් කරන අතර, අනෙක් පැත්තෙන්, විද්‍යාවේ විවෘත ප්‍රවේශය සඳහා

ප්‍රයෝජනවත් අන්තර්ජාතික විසඳුම් සඳහා බලපෑම් කරයි (ටෙනන්ට්, 2018b). එහි ප්‍රතිඵලයක් ලෙස, ලිපියේ පෞද්ගලික දේපල ආකෘතිය අභෝසි කරන අතරම, ඉදිරිපත් කිරීම්වල නිරන්තර ප්‍රවාහය පවත්වා ගෙන යනු ලබයි. එල්සෙවියර් වැනි ප්‍රකාශකයින්ගේ ලාභවල ස්ථාවරත්වය, මහජන මුදල් පසුම්බියේ වැඩිවන වියදමින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම අවස්ථාවේ දී විවේචනයේ කාර්යය වන්නේ ශාස්ත්‍රීය ප්‍රකාශනයේ ධනවාදී ආකෘතිය ආරක්ෂා කිරීම සඳහා ශාස්ත්‍රීය කීර්තිය බෙදා හැරීමේ යාන්ත්‍රණයන්හි කාර්යභාරය හෙළිදරව් කිරීම සහ පැහැදිලි කිරීමයි (Szadkowski, 2016 b).

**අනාගතය ගොඩනැගීම**

මෑත කාලීන අරගල මාලාවෙන් විශ්වවිද්‍යාලය පිළිබඳ විවේචන වර්ධනය කළ බොහෝ පර්යේෂකයන්ට (Roggero, 2011; Kamola and Meyerhoff, 2009; Pusey, 2017), මහජන පරීක්ෂාව සහ අලෙවිකරණයේ විෂම චක්‍රයක සිරවී ඇති විශ්වවිද්‍යාලයට විකල්පයක් සංකල්පනය කිරීමේ අවශ්‍යතාවය ද ධනවාදයට සහ එහි ගෝලීය පාලනයට විකල්පයක් සිතීමට පදනමක් සපයයි. මෙවැනි විකල්ප තේරුම් ගැනීමට නම් අපි නැවත සැමවිටම ප්‍රාග්ධනය තුළ සහ ප්‍රාග්ධනයට එරෙහිව පවතින සහ එමඟින් ඉන් ඔබ්බට යාමේ හැකියාව ඇති කරන ශ්‍රමය සහ ප්‍රාග්ධනය අතර ස්ථානීය සම්බන්ධතාවය වෙත යොමු විය යුතුය. (Hall and Winn, 2017). මෑත කාලීන අධ්‍යයන අරගල තුළ එවැනි විශ්වාසයක් බෙදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, අර්බුදයක සිටින විශ්වවිද්‍යාලයේ වත්මන් තත්ත්වයෙන් ඔබ්බට යොමු වන සහ විද්‍යාවේ ස්වයං-පාලිත, ප්‍රජාතන්ත්‍රවාදීව සංවිධානය වූ ගෝලීය, ජාතික සහ දේශීය සහයෝගීතා ජාලයන් වැළඳ ගන්නා උසස් අධ්‍යාපන යථාර්ථයක ප්‍රතිරූපය මතු වේ. එමඟින් එය කීර්තිය සහ එය සක්‍රීය කරන සහ උත්තේජනය කරන තරඟකාරීත්වයේ රීතිය මත පදනම් වූ අධ්‍යයන ස්ථරීකරණයෙන් ඔබ්බට යාමට දිරිමත් කරයි.

ප්‍රාග්ධනයේ පාලනය සහ උසස් අධ්‍යාපනය තුළ එය ස්ථාපිත කරන සබඳතාවලින් ඔබ්බට යන මාර්ගය වර්තමානයේ සමුපකාර විශ්වවිද්‍යාල ව්‍යාපාරය විසින් නිර්මාණය කර ඇත. නියරි සහ වින් (2017) විසින් පෙන්වා දෙන පරිදි, සමුපකාර සමිති, ප්‍රාග්ධන සබඳතා

සෘජුවම අහෝසි කිරීමට උපකල්පනය නොකරයි, ඒ වෙනුවට ඒවා ධනවාදී දේපළ හා ශ්‍රමයේ ස්වරූපය ඉක්මවා යන, නව සමුපකාර සමාජ සමෘද්ධියේ සංවර්ධනයට හා දියුණුවට දායක වේ. ජොස් වින් (2015) විසින් නිවැරදිව සඳහන් කර ඇති පරිදි, මෙම ප්‍රිස්මය හරහා බැලූ විට, සමුපකාර විශ්වවිද්‍යාලය ගුප්ත ආයතනයක් වන අතර වර්තමානයේ එය ළදරු අවධියේ පවතී. නිදසුන් වශයෙන්, මොන්ඩ්‍රගන් සමුපකාර විශ්වවිද්‍යාලයේ දිගුකාලීන අත්හදා බැලීම (රයිට්, ග්‍රීන්වුඩ් සහ බෝඩන් 2011), 2019-2020 අධ්‍යයන වර්ෂය තුළ උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබා ගැනීමට අපේක්ෂා කරන සමුපකාර විශ්වවිද්‍යාලය පිහිටුවීම හා එක්සත් රාජධානියේ ලින්කන්හි පිහිටි කුඩා පරිමාණ සමාජ විද්‍යා මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය (නියරි සහ වින් 2017) වැනි සමකාලීන ව්‍යාපෘති අපට දැනටමත් පෙන්වා දිය හැකිය. කෙසේ වෙතත්, එවැනි ව්‍යාපෘති හුදකලා අවස්ථා වන තාක් කල්, ඒවා දැනුම නිෂ්පාදන පරිපථවලට සම්බන්ධ කර ඇති කොන්දේසි සාකච්ඡා කිරීමට කේවල් කිරීමේ බලය ඔවුන්ට අහිමි වනු ඇත (De Angelis, 2017). එබැවින්, ධනේශ්වර තරඟකාරිත්වයේ බලහත්කාර නීති ඉදිරියට යනු ඇත. මෙම අවදානම වළක්වා ගත හැකි එක් ක්‍රමයක් නම්, රාජ්‍ය අංශය තුළ සිටම සමුපකාර වටිනාකම් සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය නැවත දිශානතියට පත් කිරීම ආරම්භ කිරීමයි. රාජ්‍ය විශ්වවිද්‍යාල සමුපකාර බවට පරිවර්තනය කිරීම සඳහා වින් මාර්ග තුනක් වෙන්කර හඳුනා ගත්තේය: 1. නීතිමය සහ ව්‍යවස්ථාපිත ක්‍රම මගින් පවතින විශ්වවිද්‍යාල සමුපකාර බවට විධිමත් ලෙස පරිවර්තනය කිරීම; 2. සමුපකාර ලෙස පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමෙන්, සමුපකාර වටිනාකම් සහ මූලධර්ම ආයතනික උපාය මාර්ගවලට ඇතුළත් කිරීමෙන්, සමුපකාර වටිනාකම් සහ මූලධර්ම ඔස්සේ ඉගැන්වූ අධ්‍යයන වැඩසටහන් ස්ථාපිත කිරීමෙන් අපගේ ආයතන තථ්‍ය සමුපකාර බවට විසුරුවා හැරීම; සහ තෙවනුව, පවතින විශ්වවිද්‍යාල පද්ධතිය සමඟ නව සමුපකාර උසස් අධ්‍යාපන ආකාර නිර්මාණය කිරීම (Winn, 2015c). මේ අනුව පළමු මාර්ගය 'පරිවර්තනය' (conversion) වන අතර, දෙවැන්න 'විසුරුවා හැරීම' (dissolution) වන අතර, තෙවැන්න 'නිර්මාණය' (creation) වේ (වින්, 2015, 41). අනාගත විශ්වවිද්‍යාලය තුළ දැනුම හා ඉගෙනුම් ක්‍රියාවලීන්හි පොදුරාජ්‍ය මණ්ඩලයේ සමාජීය හා පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී

කළමනාකරණය සඳහා කොන්දේසි සංවර්ධනය කිරීම සහ තහවුරු කිරීම සඳහා මෙම තුනම දායක විය හැකිය.

**නිගමනය**

මෙම ලිපියේ අරමුණ අධ්‍යාපන දර්ශනය තුළ මාක්ස් ස්ථානගත වන්නේ කෙසේද යන්න හඳුනා ගැනීමයි. ඉහත උත්සාහය විවේචනාත්මක විශ්වවිද්‍යාල අධ්‍යයනයන් සඳහා විකල්ප ඥානවිද්‍යාත්මක රාමුවක් ගෙනහැර දැක්වීමේ අවශ්‍යතාව මාක්ස් හරහා පෙන්වාදීමයි. එමගින් 'අර්බුදයේ පවත්නා විශ්වවිද්‍යාලය' පිළිබඳ වත්මන් ආඛ්‍යානවල සීමාවන් ඉක්මවා යන අතර විශ්වවිද්‍යාලය වත්මන් දේශපාලන හා ආර්ථික මෙන්ම අධ්‍යයන ඇණහිටීමෙන් ඔබ්බට ගෙන යා හැකිය. විවේචනය යනු විශ්වවිද්‍යාල අර්බුදයේ සන්දර්භය තුළම සිදු කරන මැදිහත්වීමකි. අර්බුදයේ නිශ්චිත සමෝච්ඡයන් සකස් කිරීමේදී, අර්බුදකාරී තත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදීමේ දී සහ විභව නිෂ්පාදන ප්‍රතිවිරෝධතා හඳුනා ගැනීමේ දී, ඒවා අරගලය හරහා විසඳා ගත හැකිය යන අර්ථයෙන්, මෙවැනි විවේචනයක කොන්දේසි නිර්මාණය කරන අතර එය වර්තමාන සීමාවන් ඉක්මවා යන අනාගත ක්ෂිතිජයක් සාක්ෂාත් කර ගැනීම සඳහා බලාපොරොත්තුවක් සපයයි. විචාරාත්මක විශ්වවිද්‍යාල අධ්‍යයනයන් පිළිබඳ අපගේ මෙම විවේචනය මෙහෙයවනු ලබන්නේ, අප අපේක්ෂා කරන විශ්වවිද්‍යාලය ඓතිහාසික සංවර්ධනයේ නොවැළැක්විය හැකි සහ නොනවතින නීති මගින් මෙහෙයවනු ලබන ස්වයංක්‍රීය හා අපෝහක ව්‍යාපාරයක ප්‍රතිඵලයක් ලෙස මතු නොවන බවට ඇති විශ්වාසයෙනි. පැරණි ධනේශ්වර විශ්වවිද්‍යාල රාමුව තමන්ගේම ප්‍රතිවිරෝධතා හරහා ස්වයංසිද්ධව බිඳ වැටෙන විට මෙම පරිවර්තනීය විශ්වවිද්‍යාලය සඳහා පෙරනිමිති පෙනේ. එය මාක්ස්වාදී විචාරාත්මක අධ්‍යාපන ප්‍රවේශය හඳුනාගත් විවේචන අවස්ථා තුනෙහි අඛණ්ඩතාව මත රඳා පවතී. එබැවින්, අපගේ අරගලය, ප්‍රාග්ධනය යටතේ විශ්වවිද්‍යාලය තුළ සිටීමේ අත්දැකීම පිළිබඳ විචාරයක් වෙත යොමු විය යුතුය. ධනේශ්වර පාලනයට එරෙහිව යාමෙන් පමණක් සමුච්චය කිරීමේ සහ ස්වයං-අගය කිරීමේ ක්‍රියාවලීන්ට බාධා කළ හැකි අතර අර්බුදයේ පවත්නා විශ්වවිද්‍යාලයේ වත්මන් ස්වරූපයට ඔබ්බෙන් ඇති ක්ෂිතිජයක් දෘශ්‍යමාන කළ හැකිය. මේ අනුව, මෙවැනි විවේචනාත්මක

පර්යාවලෝකනයන් හරහා විචාරාත්මක අධ්‍යාපනයකට අවශ්‍ය කොන්දේසිය ජනනය කරයි, එමඟින් ප්‍රතිපත්තිමය වශයෙන්, න්‍යාය සහ භාවිතය අතර ද්විකෝටික භාවය විසුරුවා හැරිය හැකි ප්‍රතික්‍රියා ඇති කළ හැකිය. මාක්ස්වාදී අධ්‍යාපන දර්ශනයක ස්වභාවය අපට හඳුනාගත හැක්කේ මෙවැනි විචාරයන් තුළ පමණි.

## මූලාශ්‍රය නාමාවලිය

Ball, S., and D. Youdell. 2008. *Hidden Privatisation in Public Education*. Brussels: Education International.

Bell, P., and H. Cleaver. 1982. "Marx's Theory of Crisis as a Theory of Class Struggle." *Research in Political Economy* 5:1–61.

Bergfeld, M. 2018. "Do You Believe in Life after Work? the University and College Union Strike in Britain." *Transfer 24* (2): 233–236.

Blackmore, P. 2016. *Prestige in Academic Life: Excellence and Exclusion*. London: Routledge.

Bonefeld, W. 2014. *Critical Theory and the Critique of Political Economy*. London: Bloomsbury.

Bonefeld, W. 2016. "Negative Dialectics and the Critique of Economic Objectivity." *History of the Human Sciences 29* (2)

Bonefeld, W., R. Gunn, and K. Psychopedis, eds. 1992. *Open Marxism-Volume I: Dialectics and History*. London: Pluto Press.

Cleaver, H. 2017. *Rupturing the Dialectic: The Struggle against Work, Money, and Financialization*. Chico CA and Edinburgh: AK Press.

Courtois, A., and T. O'Keefe. 2015. "Precarity in the Ivory Cage: Neoliberalism and Casualisation of Work in the Irish Higher Education Sector." J*ournal for Critical Education Policy Studies 13* (1): 43–66.

De Angelis, M. 2017. *Omnia Sunt Communia*. London: Zed Books.

De Angelis, M., and D. Harvie. 2009. "'Cognitive Capitalism' and the Rat-race: How Capital Measures Immaterial Labour in British Universities." *Historical Materialism 17* (3): 3–30.

Dinerstein, A. C. 2015. *The Politics of Autonomy in Latin America. The Art of Organising Hope*. Basingstoke: Palgrave Macmillan.

Eve, M. 2015. *Open Access and the Humanities*. Cambridge: Cambridge University Press.

Fraser, N. 1995. "What's Critical about Critical Theory? the Case of Habermas and Gender." *New German Critique 35*: 97–131.

Gibney, E. 2018. "UK Universities Cope with Disruption from Huge Strike." *Nature 555* (1, March): 14–15.

Roggero, G. 2011. *The Production of Living Knowledge*. Philadelphia: Temple University Press.

Hall, R. 2018. "On the Alienation of Academic Labour and the Possibilities for Mass Intellectuality." *Triple C 16*

Hall, R., and J. Winn, eds. 2017. *Mass Intellectuality and Democratic Leadership in Higher Education*. London: Bloomsbury.

Halvorsen, S. 2015. "Militant Research Against and Beyond Itself: Critical Perspectives from the University and Occupy London." *Area 47*

Hardt, M., and A. Negri. 1994. *Labor of Dionysus. A Critique of the State-Form*. Minneapolis: University of Minnesota Press.

Harvey, D. 2012. *A Companion to Marx's Capital. Volume II*. London: Verso.

Harvey, D. 2018. *Limits to Capital*. London: Verso.

Hesketh, A. 2018. "The Solution to University Pensions? Better Fund Managers." *The Guardian*, February 22.

Holloway, J. 1987. "A Note on Fordism and Neo-Fordism." *Common Sense: Journal of Edinburgh Conference of Socialist Economists 1*: 52–59.

Holloway, J. 1992. "Crisis, Fetishism, Class Composition." *In Open Marxism - Volume II: Theory and Practice,* edited by B. Werner, G. Richard, and P. KÈmas, 145–169. London: Pluto Press.

Holloway, J. 2009. "Negative and Positive Autonomism, or Why Adorno? Part 2." *In Negativity & Revolution. Adorno and Political Activism*, edited by H. John, M. Fernando, and T. Sergio, 95–100. London: Pluto Press.

Holloway, J. 2016. *In, Against, and Beyond Capitalism*. Oakland: PM Press.

Holloway, J., F. Matamoros, and S. Tischler, eds. 2009. *Negativity & Revolution. Adorno and Political Activism*. London: Pluto Press.

Jongbloed, B. 2003. "Marketisation in Higher Education: Clark's Triangle and the Essential Ingredients of Markets." *Higher Education Quarterly 57*

Kamola, I., and E. Meyerhoff. 2009. "Creating Commons: Divided Governance, Participatory Management, and Struggles Against Enclosure in the University." *Polygraph 21*: 5–27.

Kant, I. 1979. *The Conflict of the Faculties*. New-York: Abaris Books.

Koselleck, R. 1988. *Critique and Crisis: Enlightenment and the Pathogenesis of Modern Society*. Cambridge, MA: MIT Press.

KÈelleck, R. 2006. "Crisis." *Journal of the History of Ideas 67* (2): 357–400.

Larivière, V., S. Haustein, and P. Mongeon. 2015. "*The Oligopoly of Academic Publishers in the Digital Era*."

Lebowitz, M. 2003. *Beyond Capital: Marx's Political Economy of the Working Class*. 2nd ed. Basingstoke: Palgrave Macmillan.

Lebowitz, M. 2005. "Holloway's Scream: Full of Sound and Fury." *Historical Materialism 13*

London Edinburgh Weekend Return Group. 1980. *In & against the State*. London: Pluto Press.

Marginson, S. 2013. "The Impossibility of Capitalist Markets in Higher Education." *Journal of Education Policy 28*

Marx, K. 1973. *Grundrisse*. London: Penguin Books.

Marx, K. 1976. *Capital. Volume I*. London: Penguin Books.

Marx, K. 1981. *Capital. Volume III*. London: Penguin Books.

Marx, K., and F. Engels. 1968. *The German Ideology*. Moscow: Progress Publishers.

McCowan, T. 2017. "Higher Education, Unbundling, and the End of the University as We Know It." *Oxford Review of Education 43* (6):

Micocci, A. 2010. *The Metaphysics of Capitalism*. Lanham MD: Lexington Books.

Mirowski, P. 2018. "The Future(s) of Open Science." *Social Studies of Science 48*

Münch, R. 2014. *Academic Capitalism. Universities in the Global Struggle for Excellence*. New York and London: Routledge.

Naidoo, R. 2018. "The Competition Fetish in Higher Education: Shamans, Mind Snares and Consequences." *European Educational Research Journal*. doi:10.1177/1474904118784839.

Neary, M., and S. Amsler. 2012. "Occupy: A New Pedagogy of Space and Time?" *Journal for Critical Education Policy Studies 10* (2): 106–138.

Neary, M., and J. Winn. 2017. "Beyond Public and Private: A Framework for Co-operative Higher Education." *Open Library of Humanities 3* (2): 1–36.

Oliveira, M. B. 2013. "On the Commodification of Science: The Programmatic Dimension." *Science & Education 22*

Peekhaus, W. 2012. "The EnclÈure and Alienation of Academic Publishing: Lessons for the Professoriate." *Triple C*

Pitts, F. H. 2017. *Critiquing Capitalism Today: New Ways to Read Marx*. Basingstoke: Palgrave Macmillan.

Posada, A., and G. Chen. 2018. *Inequality in Knowledge Production: The Integration of Academic Infrastructure by BigPublishers*. Toronto: ELPUB.

Pusey, A. 2017. "Towards a University of the Common." *Open Library of Humanities 3* (1): 1–27.

Readings, B. 1997. *The University in Ruins*. Cambridge, MA: Harvard.

Rikowski, G. 2015. "Crises, Commodities and Education: Disruptions, Eruptions, Interruptions and Ruptions." *A paper prepared for the Research in Critical Education Studies* (RiCES) Seminar, School of Education, University of Lincoln, 19th February 2025. Accessed ResearchGate:https://www.researchgate.net/profile/Glenn_Rikowski/publication/ 309431122_Crises_Commodities_and_Education_Disruptions_Eruptions_Interruptions_and_Ruptions/links/

Schrecker, E. 2010. *The Lost Soul of Higher Education*. New York: New Press.

Slaughter, S., and G. Rhoades. 2004. *Academic Capitalism and the New Economy. Markets, State and Higher Education*. Baltimore: Johns Hopkins University Press.

Smith, T. 1988. "Hegel's Theory of the Syllogism and Its Relevance to Marxists." *Radical Philosophy 48*: 30–35.

Suber, P. 2012. *Open Access*. Massachusets: MIT Press.

Szadkowski, K. 2016a. "Socially Necessary Impact/time: Notes on the Acceleration of Academic Labor, Metrics and the Transnational Association of Capitals." *Teorie vědy/Theory of Science 38* (1): 53–58.

Szadkowski, K. 2016b. "Towards an Orthodox Marxian Reading of Subsumption(s) of Academic Labour under Capital." Workplace: *A Journal for Academic Labor 28*: 9–29.

Tennant, J. 2018a. *Democratising Knowledge: A Report on the Scholarly Publisher, Elsevier*, Brussels: Education International.

Tennant, J. 2018b. "Elsevier are Corrupting Open Science." The Guardian, June 29. https://www.theguardian.com/science/political-science/2018/jun/29/elsevier-are-corrupting-open-science-in-europe. "Universities' Main Pension Pot Faces the Biggest Deficit of Any British Fund." *The Economist*, May 3, 2025. https:// www.economist.com/britain/2017/08/03/universities-main-pension-pot-faces-the-biggest-deficit-of-any-british-fund.

Vostal, F. 2016. *Accelerating Academia. The Changing Structure of Academic Time*. Basingstoke: Palgrave Macmillan.

Winn, J. 2015a. "The Co-operative University: Labour, Property and Pedagogy." *Power and Education 7* (1): 39–55.

Winn, J. 2015b. "Writing about Academic Labour." Workplace: *A Journal for Academic Labor 25*: 1–15.

Winn, J. 2015c. "Democratically Controlled, Co-operative Higher Education." *Open Democracy*, April 23. https://www.opendemocracy.net/en/opendemocracyuk/democratically-controlled-cooperative-higher-education/.

Woodcock, J. 2018. "Digital Labour in the University: Understanding the Transformations of Academic Work in the UK." *tripleC 16*

Wright, S., D. Greenwood, and R. Boden. 2011. "Report on A Field Visit to Mondragón University: A Cooperative Experience/experiment." *Learning and Teaching 4* (3): 38–56.